**ජාතික සමාජ සංවර්ධන ආයතනය**
**(ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය.)**

තනතුර : අධ්‍යක්ෂ (සමාජ සේවා විද්‍යාලය) තනතුරු 01

1. වයස් සීමාව : අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 50 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

2. අධ්‍යාපන සුදුසුකම් : බාහිර අයදුම්කරුවන්

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සමාජීය විද්‍යාවන්ගෙන් ප්‍රථම උපාධිය සමග සමාජ වැඩ (Social work) පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

(ආ) පළපුරුද්ද
රාජ්‍ය සේවයේ, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ රජය පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර (15) සමාජ වැඩ අධ්‍යාපන කළමනාකරණ අංශයන්හි පළපුරුද්දක් තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :**

(අ) ජාතික සමාජ සංවර්ධන ආයතනයේ සමාජ වැඩ අධ්‍යාපන කළමනාකරණ සේවා ගණයේ තනතුරක I ශ්‍රේණියේ අවම වශයෙන් වසර 05ක පළපුරුද්දක් තිබීම.

3. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය :

| | *නිර්ණායකය* | *ලකුණු* |
|---|---|---|
| 1 | අදාළ පරිපාලන පළපුරුද්ද | 30 |
| 2 | අදාළ අතිරේක වෘත්තීය පළපුරුද්ද | 30 |
| 3 | වෙනත් කුසලතා | 15 |
| 4 | සම්මුඛ පරීක්ෂණයේ කාර්ය සාධනය | 25 |
| | එකතුව | 100 |

4. වැටුප් පරිමාණය : H M 1 -3 – 2025 – රු. 152,500 – 15 x 4100 - රු. 214,000/=

තනතුර : **සහකාර පුස්තකාලයාධිපති තනතුරු 01**

වයස් සීමාව : අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

01. අධ්‍යාපන සුදුසුකම් : **බාහිර අයදුම්කරුවන් :**
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පුස්තකාල විඥාපන උපාධිය ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය :

| | *නිර්ණායකය* | *ලකුණු* |
|---|---|---|
| 1 | අදාළ පළපුරුද්ද | 30 |
| 2 | අදාළ අතිරේක සුදුසුකම් | 30 |

| | නිර්ණායකය | ලකුණු |
|---|---|---|
| 3 | වෙනත් කාර්යය සාධනයන්/ කුසලතා | 15 |
| 4 | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව | 25 |
| | **එකතුව** | **100** |

02. වැටුප් පරිමාණය : MA 3 -2025 - රු. 53,940 – 10 x800 – 11 x 1,190 - 10 x 1,320 - 1,350 x 5 –රු. 94,980/=

තනතුර : **වැඩ මූලික නඩත්තු තනතුරු 01**

වයස් සීමාව : අයදුම්පත් භාරන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

01. අධ්‍යාපන සුදුසුකම් :

**බාහිර අයදුම්කරුවන් :**

(අ) වැඩ මූලික නඩත්තු තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නියම කර ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතා (NVQ ) 04 වැනි මට්ටමට අඩු නොවන්නාවූ **විදුලි කාර්මික පාඨමාලාවක්** සාර්ථකව හදාරා සහතිකය ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

තනතුරෙහි කාර්යභාරයට අදාළව වසර පහක (05 ක) පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින්/වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ තනතුරෙහි කාර්යභාරයට අනුකූලවන ජාතික වෘත්තීය කුසලතා (NVQ ) සිව්වැනි (04) මට්ටමට නොඅඩු මට්ටමක වෘත්තීය පරීක්ෂණයකින් (Trade Test ) සමත් වන ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL 2) හෝ ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) සේවා ගණයක සේවකයින්;

හෝ

තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) හතර (04) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. **(වායු සමීකරණ, විදුලිය, ජලය, වාහන, ගොඩනැගිලි හා භූමි නඩත්තු පිළිබඳව (NVQ ) හතර (04) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් )**

සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය :

| | නිර්ණායකය | ලකුණු |
|---|---|---|
| 1 | අදාළ පළපුරුද්ද | 20 |
| 2 | අදාළ අතිරේක අධ්‍යාපනික සුදුසුකම් | 20 |
| 3 | සම්මුඛ පරීක්ෂණයේ දී පෙන්වන ලද කාර්ය සාධනය | 60 |
| | **එකතුව** | **100** |

02. වැටුප් පරිමාණය : PL 3 -2025-රු. 43,280 – 10 x 490 - 10 x 540 – 10 x 590 – 12 x 630 – රු. 67,040/=

5. තනතුරු සඳහා සේවා නියුක්ත කරවීමේ කොන්දේසි -

1. සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
2. තනතුර ස්ථිරය.

3. රජයේ අනුමත ප්‍රතිශතයන්ට අනුව සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.
4. තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

**සටහන :** මෙම තනතුර පුරප්පාඩුව පවතින්නේ සීදූව ප්‍රධාන කාර්යාලයේ වන අතර තෝරා ගන්නා අය ප්‍රධාන කාර්යාලයේ සේවය කළ යුතුය.

සේවා කොන්දේසි : 1992 අංක 41 දරන ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ විධිවිධානවලට හා රජය විසින් වරින්වර පනවනු ලබන නීති රීති හා රෙගුලාසිවලට යටත් විය යුතුය.

බඳවා ගැනීමේ ක්‍රමවේදය : පත්වීම් බලධාරියා විසින් නියම කරනු ලබන පරිදි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව තෝරා ගැනීම සිදු කෙරේ.

අයදුම්කරුවන් සම්පූර්ණ ජීවදත්ත තොරතුරු ඇතුළත් අයදුම්පත් පහත ලිපිනයට **2025.06.06** දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් කරන තනතුර ලිපිකවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අපැහැදිලි හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය අංශයේ සේවයේ නියුතු නිලධාරීන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. අධ්‍යක්ෂ (සමාජ සේවා විද්‍යාලය) සඳහා අයදුම්පත් කැඳවීමට 2024.11.08 දිනැතිව පළකර තිබූ *ගැසට්* නිවේදනයට අනුව තනතුර සඳහා අයදුම්පත් යොමු කරන ලද අයදුම්කරුවන් ද නැවත සකසන ලද අයදුම්පත් පහත ලිපිනයට යොමුකළ යුතුය.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය වසන්තා සුබසිංහ,
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ)
ජාතික සමාජ සංවර්ධන ආයතනය.

2025 මැයි මස 21 වැනි දින,
ජාතික සමාජ සංවර්ධන ආයතනය,
ලියනගේමුල්ල,
සීදූව.

05-195